### 4 . 3 සංස්කෘතිය

### හැඳින්වීම

- ක්‍රි . පූ තුන්වන සියවසේ දී සිදු වූ මහින්දාගමනයෙන් පසුව මෙරට ප්‍රධාන ආගම ලෙස බුදු දහම පැවතුණි.
- පසුව ඉන්දියානු වෙළඳුන් සහ වෙනත් පිරිස් මාර්ගයෙන් හින්දු ආගමද , ක්‍රි . ව 6 වන සියවසින් පසුව මධ්‍යධරණී ප්‍රදේශයේ වර්ධනය වූ වෙළඳාමේ ප්‍රතිඵලයක් ලෙස ඉස්ලාම් ධර්මය ද ක්‍රි . ව 16 වන සියවසින් පසු යුරෝපීයන් පෙරදිගට පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්තියානි ධර්මය ද මෙරටට හඳුන්වා දෙනු ලැබිණි.
- බුදු දහමට නොමද රාජ්‍ය අනුග්‍රහය ලැබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස බුදු දහම කේන්ද්‍ර කරගත් ප්‍රබල සංස්කෘතියක් මෙරට ස්ථාපිත විය. එය සෑම අංශයක් පුරාම බලපැවැත්වුණි.
- හින්දු ආගම ද අනුරාධපුර යුගයේ මුල් අවධියේ සිටම මෙරට පැවති අතර හින්දු භක්තිකයින් සඳහා ඉදි වූ හින්දු කෝවිල් දිවයිනේ විවිධ ප්‍රදේශවල දක්නට ලැබුණි.
- අරාබි රටවල් සමඟ පැවති වෙළඳ සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස ඉස්ලාම් ධර්මය මෙරටට පැමිණි අතර අරාබි ග්‍රන්ථ රූසක ලංකාව හා අරාබිය අතර පැවති සබඳතා පිළිබඳ සඳහන්ය.

### ක්‍රියාකාරකම

1) ශ්‍රී ලංකාවේ බුදු දහමේ වර්ධනය හා ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විස්තර ඇතුළත් පහත සටහන සම්පූර්ණ කරන්න.



3) පැරණි ශ්‍රී ලංකාවේ පැවති වෙනත් ආගම්වල තොරතුරු ඇතුළත් කරමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආගම | මූලාශ්‍රයන් හා ඒවායේ එන තොරතුරු | ආගමික ස්ථාන පිළිබඳ සාක්ෂි |
|---|---|---|
| හින්දු ආගම | | |
| ඉස්ලාම් ධර්මය | | |
| කතෝලික ආගම | | |